සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## කෘෂි විද්‍යාව - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

---

01 ශාක සෛල තුළ ශ්වසනය සිදුවන්නේ,
(1) වර්ණදේහවල ය. (2) න්‍යෂ්ටියේ ය.
(3) හරිතලවවල ය. (4) මයිටොකොන්ඩ්‍රියාවල ය.
(5) රයිබොසෝමවල ය.

02 ශ්‍රී ලංකාවේ වඩාත් බහුල පස් කාණ්ඩ වනුයේ,
(1) නොමේරූ දුඹුරු ලෝම පස හා ග්‍රුමුසොල් පසය.
(2) රතු දුඹුරු පස හා රතු කහ පොඩ්සොලික් පසය.
(3) චූර්ණමය නොවන දුඹුරු පස හා සොලොඩයිස් සොලොනයිට්ස් පසය.
(4) දියලු පස හා රතු දුඹුරු ලැටසොලික් පසය.
(5) ලැටසෝල් පස හා රෙගොසෝල් පසය.

03 පහත දැක්වෙන දිස්ත්‍රික්ක අතුරෙන් වැඩිම ජනගහනයක් ඇති දිස්ත්‍රික්ක මොනවා ද?
(1) ගාල්ල, කොළඹ, කුරුණෑගල (2) කොළඹ, ගාල්ල, නුවර
(3) රත්නපුරය, කුරුණෑගල, කොළඹ (4) කොළඹ, ගාල්ල, ගම්පහ
(5) කොළඹ, ගම්පහ, කුරුණෑගල

04 අනවශ්‍ය මේද අම්ල වනුයේ,
(1) ලිනොලෙයික්, ලිනොලෙනික් සහ ඇරපිඩික් අම්ලයි.
(2) ලිනොලෙනික්, ඇරඩිඩොනික් සහ ස්ටියරික් අම්ලයි.
(3) ලිනෝලෙයික්, ඇරඩිඩොනික් සහ ලෝරික් අම්ලයි.
(4) ලිනොලෙයික්, ලිනොලෙනික් සහ ඇරඩිඩොනික් අම්ලයි.
(5) ලිනොලෙයික්, ඔලෙයික් සහ ලෝරික් අම්ලයි.

05 නඟුල බහුලව යොදාගැනෙනුයේ,
(1) ප්‍රථමික බිම් සැකසීමේ දී ය. (2) ද්විතීයික බිම් සැකසීමේ දී ය.
(3) අවම බිම් සැකසීමේ දී ය. (4) අතුරුයත්ගෑමේ දී ය.
(5) ශුන්‍ය බිම් සැකසීමේ දී ය.

06 මුදවන ලද කිරිවල නිපදවෙන ප්‍රධාන අම්ලය වනුයේ,
(1) ලැක්ටික්ය (2) ඇසිටික්ය (3) සිට්රික්ය (4) ප්‍රොපියොනික්ය (5) බියුටිරික්ය

07 කිකිළි බිත්තරයක බිජෞෂණ කාලය
(1) දින 24 කි. (2) දින 28 කි. (3) දින 15 කි. (4) දින 18 කි. (5) දින 21 කි.

08 සත්ත්ව ආහාර සඳහා සහල් නිවුඩු යොදාගැනෙන්නේ,
(1) ඛණිජ පරිපූරකයක් ලෙසය. (2) ශක්ති පරිපූරකයක් ලෙසය.
(3) විටමින පරිපූරකයක් ලෙසය. (4) ප්‍රෝටීන පරිපූරකයක් ලෙසය.
(5) කාබෝහයිඩ්රේට පරිපූරකයක් ලෙසය.

09 එළදෙනකගේ ගර්භණී කාලය වන්නේ,

(1) මාස 7 කි. (2) මාස 5 කි. (3) මාස 9 කි. (4) මාස 6 කි. (5) මාස 12 කි.

10 හොඳ ගුණාත්වයෙන් යුත් තෘණ සයිලේජ්වල ඇති වඩාත් ප්‍රමුඛ වාෂ්පශීලී මේද අම්ලය වනුයේ,

(1) ප්‍රොපියොනික් අම්ලය වේ. (2) පයිරුවික් අම්ලය වේ.
(3) ඇසිටික් අම්ලය වේ. (4) බියුටිරික් අම්ලය වේ.
(5) ෆෝමික් අම්ලය වේ.

11 වියළි කලාපයේ වගා කෙරෙන ධාන්‍ය බෝගයකට වාරි ජල සම්පාදනය කිරීමේ දී සලකා බැලිය යුතු වැදගත් ම සාධකය වනුයේ,

(1) ජල පරිමාවය (2) ජලයේ ගැඹුරය
(3) ජල ප්‍රභවය ය (4) ජලය ලබාගත හැකි කාල වකවානුවය
(5) ජලයේ වර්ණය ය

12 පූර්ණ රූපාන්තරණය දක්වන කෘමි ගොනු වනුයේ,

(1) හොමොප්ටෙරා, හෙමිප්ටෙරා සහ තයිසනොප්ටෙරා වේ.
(2) ඔතොප්ටෙරා, ලෙපිඩොප්ටෙරා සහ කෝලියෙප්ටෙරා වේ.
(3) ඩිප්ටෙරා, කොලියොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.
(4) ලෙපිඩොප්ටෙරා, ඩිප්ටෙරා සහ කොලියොප්ටෙරා වේ.
(5) කොලියොප්ටෙරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.

13 ප්‍රතිශතයක් ලෙස දක්වන කාලගුණික පරාමිතිය වන්නේ,

(1) වර්ෂාපතනය (2) ආලෝක තීව්‍රතාවය
(3) දවසේ උපරිම උෂ්ණත්වය (4) සුළඟේ වේගය
(5) සාපේක්ෂ ආර්ද්‍රතාවය

14 දෛනික වාෂ්පීකරණ උත්ස්වේදනය මිලි මීටර 4 ක් වූ ප්‍රදේශයක පිහිටි හෙක්ටයාර 1 ක වගා බිමකට සැපයිය යුතු අවම දෛනික ජල පරිමාව

(1) $0.4m^3$ (2) $4m^3$ (3) $400m^3$ (4) $0.04m^3$ (5) $40m^3$

15 සැන්තමොනාස් ඔරයිසියේ යනු

(1) මෘතෝපජීවී දිලීරයකි. (2) ව්‍යාධිජනක වෛරසයකි.
(3) මෘතෝපජීවී බැක්ටීරියාවකි. (4) ශාක ව්‍යාධිජනක බැක්ටීරියාවකි.
(5) ශාක පරපෝෂී දිලීරයකි.

16 තාවකාලික ප්‍රචාරක ව්‍යුහ ප්‍රධාන වශයෙන් භාවිතා වනුයේ,

(1) බෝග වර්ධනයේ අවධි කාල පරිච්ඡේදවලදී පරිසරය පාලනය කිරීමට ය.
(2) බෝගය පුෂ්පීකරණ අවධියේ සුළඟේ ප්‍රවේගය පාලනය කිරීමට ය.
(3) බෝගයේ වර්ධක අවධියේ දී අධික ආර්ද්‍රතාවක් සැපයීමට ය.
(4) බෝගයේ අස්වනු නෙලන අවධියේ දී පරිසරය පාලනය කිරීමට ය.
(5) බෝගයේ ප්‍රජනක අවධියේ දී පාංශු තෙතමනය පාලනය කිරීමට ය.

17 වෙළඳපළ අතිරික්තයක් ඇති වනුයේ,

(1) වෙළඳපළ සැපයුම ඉල්ලුමට වඩා වැඩිවන විටය.
(2) වෙළඳපළ ඉල්ලුම සැපයුමට වඩා වැඩිවන විටය.
(3) සැපයුම් වක්‍රය වමට විතැන් වූ විටය.
(4) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වූ විටය.
(5) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වූ විටය.

18 කෘෂිකර්මාන්තයේ දී ඉවක් බවක් නැතිව පළිබෝධ නාශක භාවිතයෙන්

A පළිබෝධ ප්‍රතිරෝධිතාව ඇතිවේ.
B පළිබෝධ නැවත ඇතිවීම සිදුවේ.
C පරිසර දූෂණය සිදුවේ.

ඉහත කරුණු වලින් නිවැරදි වන්නේ,

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C සියල්ලම

19 කිරි මුදාහැරීම නිෂේධනය කළ හැක්කේ,

(1) ඉන්සියුලින්වලට ය.
(2) ඊස්ට්‍රජන්වලට ය.
(3) ඇඩ්‍රිනලීන්වලට ය.
(4) සූර්යාලෝකයට ය.
(5) ඔක්සිටෝසින්වලට ය.

20 බ්‍රොයිලර් ගොවිපළක පිරිවැය ශ්‍රිතය තීරණය වන්නේ,

(1) ගොවිපළේ කළමනාකරණය මගිනි.
(2) ගොවිපළෙහි වයස මගිනි.
(3) ගොවිපළ සතු ස්ථාවර වත්කම් මගිනි.
(4) ගොවිපල නිෂ්පාදන ශ්‍රිතය මගිනි.
(5) බ්‍රොයිලර් කුකුළු මස්වල මිල මගිනි.

21 සම නිෂ්පාදන වක්‍රය මගින් විස්තර කරන්නේ,

(1) නිෂ්පාදන නිෂ්පාදන අතර සම්බන්ධතාවය
(2) සාධක පිරිවැය අතර සම්බන්ධතාවය
(3) සාධක සාධක අතර සම්බන්ධතාවය
(4) නිෂ්පාදන නිෂ්පාදන අතර සම්බන්ධතාවය
(5) සාධක ලාභය අතර සම්බන්ධතාවය

22 පොලිතීන් ගෘහ තුළ දී ශාක අතු කැබලිවල මුල් ඇදීම වර්ධනය වනුයේ ප්‍රධාන වශයෙන්

(1) අර්ධ සෙවන තත්ත්වය සහ ඉහළ ආර්ද්‍රතාව නිසාය.
(2) ඉහළ උෂ්ණත්වය සහ ඉහළ ආර්ද්‍රතාව නිසාය.
(3) අර්ධ සෙවන තත්ත්වය සහ ප්‍රශස්ත මට්ටමක ඇති ආර්ද්‍රතාවය නිසාය.
(4) ඉහළ උෂ්ණත්වය සහ අඩු ආර්ද්‍රතාව නිසාය.
(5) ඉහළ උෂ්ණත්වය සහ අර්ධ සෙවන තත්ත්වය නිසාය.

23 වී වගාවකට පොහොර යෙදීමෙන්

(1) මුළු පිරිවැය වැඩිවේ.
(2) විචල්‍ය පිරිවැය සහ මුළු පිරිවැය වැඩිවේ.
(3) ස්ථාවර පිරිවැය සහ මුළු පිරිවැය වැඩිවේ.
(4) සමස්ථ පිරිවැය වැඩිවේ.
(5) ප්‍රාග්ධන පිරිවැය වැඩිවේ.

24 දළ ආහාරවල

(1) 18% අඩුවෙන් දළ තන්තු අඩංගු වේ.
(2) 18% වැඩියෙන් දළ තන්තු අඩංගු වේ.
(3) 20% වැඩියෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.
(4) 20% වැඩියෙන් දළ තන්තු හා දළ ප්‍රෝටීන අඩංගු වේ.
(5) 20% අඩුවෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.

25 ශාක මගින් සාන්ද්‍රණ අනුක්‍රමණයට එරෙහිව අයන උරාගැනීම වඩාත් හොඳින් විස්තර වනුයේ,

(1) ආස්‍රැතියෙනි.
(2) සක්‍රිය අවශෝෂණයෙනි.
(3) විසරණයෙනි.
(4) අක්‍රිය අවශෝෂණයෙනි.
(5) ධ්‍රැවීයතාවයෙනි.

26 වියළි කලාපයේ ගොවියෙකු අඹේවෙල ගොවිපලෙන් ෆ්‍රිෂියන් වර්ගයේ කිරි එළදෙනක මිලට ගෙන අඹේවෙල ගොවිපලට සමාන ආහාර දෙමින් ඇතිකළ ද කිරි නිෂ්පාදනය බරපතල ලෙස පහත වැටුණි. මෙයට ප්‍රධාන හේතුව විය හැක්කේ,

(1) අනුරාධපුරයේ පවතින උණුසුම් කාලගුණය ය.
(2) අනුරාධපුරයේ පවතින වියලි කාලගුණය ය.
(3) අනුරාධපුර ගොවිපොළෙහි පවතින දුර්වල සනීපාරක්ෂක තත්ත්වය ය.
(4) අනුරාධපුරයේ පවතින පරිසර දූෂණය ය.
(5) අනුරාධපුරයේ පවතින ශාක විවිධත්වය ය.

27 වාණිජ කුකුළු ගොවිපළක ප්‍රධාන දොරටුව අසල ජල ගිල්වුමක් සාදා තිබෙන අතර ගොවිපලට ඇතුළුවන වාහනවල රෝදවලට පළමුව රසායන ද්‍රව්‍ය විසුරුවා ඉන්පසු ජල ගිල්වුම හරහා ධාවනය කිරීමට සලස්වනු ලැබේ. මෙ සිදුකරනුයේ,

(1) ජෛව ආරක්ෂක ක්‍රමයක් ලෙසය.

(2) පැහැදිලි අරමුණකින් තොරවය.

(3) කුකුළු ගොවිපළවල සිදුකෙරෙන සම්ප්‍රදායයක් ලෙසය.

(4) ගොවිපළ පරිශ්‍රයට මඩ ඇතුළුවීම වැළැක්වීමට රෝද පිරිසිදු කිරීමටය.

(5) ගොවිපළ පරිශ්‍රයෙන් දූවිලි අඩුකර ගැනීමටය.

28 මන්සල් වර්ණ සටහනෙහි වර්ණ කේතයන් සඳහා ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ,

(1) රතු, කහ, නිල් හා කොළය

(2) දුඹුරු, රතු, කහ හා නිල්ය

(3) රතු, කහ, කොළ හා සුදුය

(4) කොළ, සුදු, රතු හා නිල්ය

(5) නිල්, කොළ, රතු හා තැඹිලිය

29 ශාක පෝෂණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) අංශු මාත්‍ර ප්‍රමාණවලින් අවශ්‍ය වන නිසා ක්ෂුද්‍ර පෝෂක අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ලෙස නොසැලකේ.

(2) හොඳින් සැකසූ පසක අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යවලින් තොරව ශාක වගා කළ හැකිය.

(3) සෛලයක් තුළ දක්නට ලැබෙන සෑම ඛණිජයක්ම සෛලයට අවශ්‍ය වේ.

(4) නයිට්‍රජන් යනු අචල ශාක පෝෂකයකි.

(5) බෝරෝන් ඌණතාව මිටි ස්ථූල කඳක් ඇතිවීමට හේතු වේ.

30 පාංශු ජල ප්‍රමාණය මැනිය හැක්කේ,

(1) පීඩනමාන ආධාරයෙනි.

(2) පීඩන බෝම්බය ආධාරයෙනි.

(3) අග්නි දීප්තමාන ආධාරයෙනි.

(4) පරමාණුක අවශෝෂණ වර්ණාවලිමානය ආධාරයෙනි.

(5) ආතතිමාන ආධාරයෙනි

31 කිරි දෙවීමට පෙර පෙරහන් කෝප්ප පරීක්ෂාව කරනුයේ,

(1) කිරිවල අඩංගු මුළු ඝණ ද්‍රව්‍ය ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට ය.

(2) බෲසෙල්ලොසිස් පරීක්ෂා කිරීමට ය.

(3) කිරිවල මේද ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට ය.

(4) කිරිවල වර්ණය ඇගයීමට ය.

(5) මැස්ටයිටිස් පරීක්ෂා කිරීමට ය.

32 කිකිළියකගේ ඩිම්බ සංසේචනය සිදුවන්නේ,

(1) මැග්නමයේ දී ය.

(2) ගර්භාෂයේ දී ය.

(3) කෘකාටයේ දී ය.

(4) යෝනි මාර්ගයේ දී ය.

(5) පුනීලයේ දී ය.

33 වැලි 55%, ලෝම 20%, මැටි 25% වූ පාංශු නියැදියක වයන පංතිය වනුයේ,

(1) රොන්මඩ සහිත මැටි ලෝම

(2) වැලිමය ලෝම

(3) වැලිමය මැටි

(4) ලෝම වැලි

(5) වැලිමය මැටි ලෝම

34 කාබනික පොහොර භාවිතයේ ප්‍රතිලාභයක් වනුයේ,

(1) පසට අවශ්‍ය පමණ පොස්පරස් ලබාදීමය.

(2) පසට අවශ්‍ය පමණ නයිට්‍රජන් ලබාදීමය.

(3) පසෙහි $P^H$ අගය 7 ඉක්මවා වැඩි කිරීමය.

(4) පසේ ජලය රඳාගැනීමේ ධාරිතාව වැඩිදියුණු වීමය.

(5) ශාක පෝෂක ඉක්මනින් පාංශු ජලයට නිදහස් කිරීමය.

35 පහත ප්‍රකාශ අතරින් පළිබෝධ නාශක යොදා ක්ෂේත්‍රයට නැවත ඇතුළුවීම සම්බන්ධයෙන් හොඳම උපදේශය වන්නේ,

(1) පළිබෝධ නාශක යෙදීමෙන් සති 2 ක් යනතුරු ක්ෂේත්‍රයට ඇතුළු නොවිය යුතුය.

(2) අස්වනු නෙලීම සඳහා පමණක් ක්ෂේත්‍රයට ඇතුළු විය යුතුය.

(3) ක්ෂේත්‍රය වියළී ගිය පසු ඇතුළු විය හැකිය.

(4) ඊළඟ පළිබෝධ නාශක යෙදීම තෙක් ක්ෂේත්‍රයට ඇතුළු නොවිය යුතුය.

(5) පළිබෝධ නාශක යෙදීමට සති 2 කට පෙර සිට ක්ෂේත්‍රයට ඇතුළු නොවිය යුතුය.

36 ආහාර තාප සැකසීමට බඳුන්කරනු ලබන්නේ,

(1) ව්‍යාධිකාරකයන් නැති කිරීම, එන්සයිම සක්‍රිය කිරීම සහ විටමින සුලභතාව දියුණු කිරීම සඳහා ය.

(2) ක්ෂුද්‍ර ජීවීන් විසින් සිදුකරන ආහාර නරක්වීම නැතිකිරීම හෝ අඩුකිරීම, ව්‍යාධිකාරකයන් නැති කිරීම සහ රුචිය ඉහළ නැංවීම සඳහා ය.

(3) එන්සයිම සක්‍රිය කිරීම, රුචිය ඉහළ නැංවීම සහ විටමින සුලභතාව දියුණු කිරීම.

(4) ක්ෂුද්‍ර ජීවීන් මගින් සිදුකරන ආහාර නරක්වීම නැතිකිරීම හෝ අඩු කිරීම.

(5) ව්‍යාධිකාරකයන් නැති කිරීම, රුචිය ඉහළ නැංවීම සහ විටමින සුලභතාව දියුණු කිරීම සඳහා ය.

37 ශ්‍රී ලංකාවේ එළවළු සහ පලතුරුවල පසු අස්වනු හානිය පිළිබඳව වඩාත් නිවැරදි වගන්තිය වන්නේ,

(1) ගොවීන්ට වඩා හොඳ ගබඩා පහසුකම් ලබාදීමෙන් එළවළු සහ පලතුරුවල පසු අස්වනු හානිය අවම කරගත හැකිය.

(2) පසු අස්වනු හානියට ප්‍රධානතම හේතුව අධික ලෙස පොහොර යෙදීමය.

(3) දුර්වල මහා මාර්ග තත්ත්වය නිසා ප්‍රවාහනයේ දී සිදුවන පසු අස්වනු හානිය අඩු කළ නොහැකිය.

(4) පෙර අස්වනු සාධක නිසි පරිදි හැසිරවීමෙන් පසු අස්වනු හානි නැති කරගත හැකිය.

(5) එළවළු හා පලතුරු වල පසු අස්වනු හානියට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ අයෝග්‍ය හැසිරවීම, ඇසිරීම සහ ප්‍රවාහනයයි.

38 ජෛව සංචරනයට වඩාත් ග්‍රාහී ශාක වනුයේ,

(1) සඵලතාව අඩු ශාක වේ. (2) ඉහළ ප්‍රජනක ධාරිතාවක් සහිත ශාක වේ.

(3) දීර්ඝ ආයුෂ සහිත ශාක වේ. (4) සඵලතාව වැඩි ශාක වේ.

(5) කෙටි ආයුෂ සහිත ශාක වේ.

39 එළකිරිවල ප්‍රධාන සංඝටකය

(1) කිරි මේද වේ. (2) ලැක්ටෝස් සීනි වේ.

(3) ජලය වේ. (4) ප්‍රෝටීන් වේ.

(5) මේද නොවන ඝණ ද්‍රව්‍ය වේ.

40 ආහාර විෂවීම ඇතිකරනු ලබන්නේ,

(1) රසායනික හා ඔක්සිජන් මගිනි. (2) ක්ෂුද්‍ර ජීවීන් හා රසායනික මගිනි.

(3) ක්ෂුද්‍ර පෝෂක හා ක්ෂුද්‍ර ජීවීන් මගිනි. (4) මහා පෝෂක හා ඔක්සිජන් මගිනි.

(5) එන්සයිම හා කාබන්ඩයොක්සයිඩ් මගිනි.

41 රජයේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථාන වනුයේ,

(1) පොළොන්නරුව, කුණ්ඩසාලේ සහ යාපනය ය

(2) නුවර එළිය, කුණ්ඩසාලේ සහ තින්නවේලිය

(3) පොළොන්නරුව, කුණ්ඩසාලේ සහ තින්නවේලිය

(4) මහනුවර, කුණ්ඩසාලේ සහ තින්නවේලිය

(5) නුවර එළිය, කුණ්ඩසාලේ සහ යාපනය ය

42 කුකුළන්ගේ ගම්බෝරෝ රෝගය සාදනුයේ,

(1) වෛරස් විසිනි. (2) බැක්ටීරියා විසිනි.

(3) කිනිතුල්ලන් විසිනි. (4) දිලීර විසිනි.

(5) මයිටාවන් විසිනි.

43 පලතුරු සැකසීමේ දී සීනි එකතු කිරීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,

(1) රසය වැඩිකිරීම සහ ක්ෂුද්‍ර ජීවීන් මර්දනය කිරීමයි.

(2) ජල රඳාසිටීමේ ධාරිතාව වැඩිකිරීම සහ ක්ෂුද්‍ර ජීවීන් මර්දනය කිරීමයි.

(3) ජල රඳාසිටීමේ ධාරිතාව වැඩිකිරීම සහ වර්ණය දියුණු කිරීමයි.

(4) ජල රඳාසිටීමේ ධාරිතාව වැඩි කිරීම සහ එන්සයිම අක්‍රිය කිරීමයි.

(5) රසය වැඩිකිරීම සහ වර්ණය දියුණු කිරීමයි.

44 කෘත්‍රිම සිංචනය සඳහා ශුක්‍රාණු එකතු කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ,

(1) මැල්සිරිපුරය (2) කුණ්ඩසාලේය (3) වැලිසරය (4) අඹේවෙලය (5) පොළොන්නරුවේය

45 පරිනත ගොවිපළ සතෙකුගේ ප්‍රෝටීන ජීර්ණය සිදුකරන ප්‍රධාන එන්සයිමය වනුයේ,

(1) පෙප්සීන් (2) ලයිපේස් (3) ඇමයිලේස් (4) ට්‍රිප්සීන් (5) ඩයිපෙප්ටයිඩේස්

46 4 $^{\circ}C$ උෂ්ණත්වයක දී යෝගට් ගබඩා කර තබාගත හැකි කාලය

(1) දින 2  4 පමණ වේ. (2) දින 5  7 පමණ වේ.

(3) දින 7  10 පමණ වේ. (4) සති 2 පමණ වේ.

(5) මාස 1 පමණ වේ.

47 ක්ලෝරිනේටඩ් හයිඩ්රොකාබන් පළිබෝධක නාශකවලට වඩා ඕර්ගනික් පොස්පේට් පළිබෝධනාශක ජනප්‍රිය වී ඇත්තේ ඕර්ගනික් පොස්පේට්

(1) යනු අර්ධ ජීව කාලය කෙටි පළිබෝධනාශකයක් නිසාය.

(2) මගින් ගොවිපොළ සේවකයාට ඇතිකරන බලපෑම අඩු නිසාය.

(3) ස්වභාවික සතුරන් නොමරන නිසාය.

(4) යෙදීමට පහසු නිසාය.

(5) ඉහත සඳහන් සියල්ලම

48 වියලි කලාපයේ බෑවුම් සහිත බිමක් හිමි ගොවියෙකුට එහි විශාල බීජ සහිත බෝගයක් සිටුවීමට අවශ්‍යව ඇත. ඔහුගේ ක්ෂේත්‍රය සඳහා වඩාත් උචිත බිම් සැකසීම වනුයේ,

(1) තැටි නගුලෙන් සී සෑමය (2) පෝරු ගෑමය.

(3) මඩ කිරීමය. (4) කැට පොඩිකිරීමය.

(5) අවම බිම් සැකසීමය.

49 වසුපැටවකුගේ අග්න්‍යාසයෙන් ස්‍රාවය වන ප්‍රධාන ප්‍රෝටීන ජීරක එන්සයිමය

(1) කයිමො ට්‍රිප්සීන්ය (2) පෙප්සීන්ය

(3) රෙනින්ය (4) ශ්ලේෂ්මලය

(5) ට්‍රිප්සීන්ය

50 කුරුළු උණ රෝගයේ රෝග කාරකයා

(1) පරපෝෂිතයෙකි. (2) වෛරසයකි.

(3) බැක්ටීරියාවකි. (4) දිලීරයකි.

(5) ප්‍රෝටෝසෝවාවකි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# කෘෂි විද්‍යාව - II

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 10 කි.)

## A කොටස ව්‍යුහගත රචනා

01 (a) පහත සඳහන් උපකරණය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත උපකරණය නම් කරන්න.

(ii) පහත කොටස් නම් කරන්න.

P ..........

Q ..........

R ..........

S ..........

T ..........

(b) (i) කිරි ගවපාලනයේ දී බහුලව භාවිතා කරනු ලබන සතුන් හඳුනාගැනීමේ ක්‍රම තුනක් ලැයිස්තුගත කරන්න.

1. ..........
2. ..........
3. ..........

(ii) ශ්‍රී ලංකාවේ සුලබව දක්නට ලැබෙන සෞම්‍ය කලාපික ගව වර්ග තුනක් නම් කරන්න.

1. ..........
2. ..........
3. ..........

(c) (i) පහත ආහාරවල ප්‍රධාන පෝෂණීය අගය සඳහන් කරන්න.

| ආහාරය | ප්‍රධාන පෝෂණීය අගය |
|---|---|
| පත්‍රමය එළවළු | ........................................ |
| කුඩා මසුන් | ........................................ |
| ඉදුණු කෙසෙල් ගෙඩි | ........................................ |

(ii) එක් එක් ක්‍රමය සඳහා උදාහරණයක් සහිතව ශ්‍රී ලංකාවේ භාවිතා වන සම්ප්‍රදායික ආහාර පරිරක්ෂණ ක්‍රම දෙකක් ලැයිස්තුගත කරන්න.

| ක්‍රමය | උදාහරණය |
|---|---|
| 1. ........................................ | ........................................ |
| 2. ........................................ | ........................................ |

(d) (i) Ca හා Fe වඩාත්ම ලබාගත හැකි ආහාර ප්‍රභව දෙක බැගින් ලැයිස්තුගත කරන්න.

| Ca | Fe |
|---|---|
| 1. ........................................ | ........................................ |
| 2. ........................................ | ........................................ |

02 (a) ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත බෝග වගාව ජනප්‍රිය වෙමින් පවතී.

(i) ආරක්ෂිත බෝග වගාව ජනප්‍රිය වීමට ප්‍රධාන හේතු තුනක් දක්වන්න.

1. ........................................
2. ........................................
3. ........................................

(ii) ආරක්ෂිත ව්‍යුහ තුනක් නම් කරන්න.

1. ........................................
2. ........................................
3. ........................................

(b) (i) පසක අඩංගු ප්‍රධාන සංඝටක හතර කවරේ ද?

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

(ii) පසක ජලය රඳවාගැනීමට දායක වන ප්‍රධාන බල සඳහන් කරන්න.

1. ........................................
2. ........................................
3. ........................................

The National e-learning Portal for The General Education

(c) (i) ශාකවල නයිට්‍රජන් ඌණතාවේ හා කැල්සියම් ඌණතාවේ ලක්ෂණ අතර ඇති ප්‍රධාන වෙනස කුමක් ද?

..........................................................................................

..........................................................................................

(ii) ශාක පරිවෘත්තියේ දී මැග්නීසියම්වල එක් ප්‍රධාන කාර්යයක් දක්වන්න.

..........................................................................................

(d) (i) ශ්‍රී ලංකාවේ බෝග වගා ක්ෂේත්‍රවල දක්නට ලැබෙන එක් විදේශ ආක්‍රමණික ශාකයක් නම් කරන්න.

..........................................................................................

(ii) විදේශ ආක්‍රමණික ශාකවල ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(iii) විදේශ ආක්‍රමණික ශාකවලින් කෘෂිකර්මයට ඇතිවන බලපෑම අවම කිරීම සඳහා සුදුසු පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

03 (a) (i) බෝග ශාකවල රෝග ඇතිකරන ව්‍යාධිජනකයින් තුනක් ලැයිස්ගත කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

3. ..........................................................................................

(ii) ශාකයන්හි රෝග වර්ධනයවීමට හිතකර වැදගත් තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(b) (i) පහත දැක්වෙන හෝර්මෝනවල සම්භවය වන ස්ථානය හා කාර්යය සඳහන් කරන්න.

| ගවයාගේ | සම්භවය වන ස්ථානය | කාර්යය |
| --- | --- | --- |
| ඊස්ට්‍රජන් | .............................. | .............................. |
| පොප්ට්ගලැනඩින් | .............................. | .............................. |
| ප්‍රොජෙස්ටරෝන් | .............................. | .............................. |

(ii) ගොවිපළ සතුන් දෙමුහුම් අභිජනනය කිරීමේ වාසි දෙකක් ලැයිස්තුගත කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

The National e-learning Portal for The General Education

(iii) ගොවිපළ සතුන්ගේ ''සුව පහසු කලාපය'' තීරණය කිරීමේ දී සලකනු ලබන ප්‍රධාන කාලගුණික සාධක 2 ක් නම් කරන්න.

1. ..............................

2. ..............................

(c) (i) කිකිළියකගේ ප්‍රජනන පද්ධතියේ විවිධ කොටස් තුනක් නම් කර එම එක් එක් කොටසින් කෙරෙන එක් ක්‍රියාවක් බැගින් නම් කරන්න.

1. ..............................

2. ..............................

3. ..............................

(ii) ගොවිපළ සතුන්ගේ මද සමායෝජනයේ වාසි තුනක් දක්වන්න.

1. ..............................

2. ..............................

3. ..............................

(d) කුකුළන් සඳහා භාවිතා වන ප්‍රධාන ප්‍රෝටීන් ආහාර සංඝටක දෙකක් හා ඒවායේ අඩංගු ප්‍රෝටීන් ප්‍රමාණය ලැයිස්තුගත කරන්න.

| | ආහාර සංඝටක | ප්‍රෝටීන් ප්‍රමාණය % |
|---|---|---|
| 1. | .............................. | .............................. |
| 2. | .............................. | .............................. |

04 (a) ගවයන්ගේ මද ලක්ෂණ හතරක් ලැයිස්තුගත කරන්න.

1. ..............................

2. ..............................

3. ..............................

4. ..............................

(b) එළදෙනකුගේ ඩිම්බ කෝෂයක ප්‍රාථමික කාර්යයන් දෙකක් ලැයිස්තුගත කරන්න.

1. ..............................

2. ..............................

(c) කිකිළි බිත්තරවල රැක්කවීමේ ප්‍රතිශතයට බලපාන වැදගත් සාධක පහක් දක්වන්න.

1. ..............................

2. ..............................

3. ..............................

4. ..............................

5. ..............................

(d) කිරි අස්වැන්නට හා කිරිවල සංයුතියට බලපාන ප්‍රධාන සාධක දෙක බැගින් සඳහන් කරන්න.

කිරි අස්වැන්න 1. ..............................

2. ..............................

කිරිවල සංයුතිය 1. ..............................

2. ..............................

The National e-learning Portal for The General Education

**B කොටස රචනා**

- **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 කි.)**

01 (a) බීජ වප්කරයක ක්‍රියාකාරීත්වය පැහැදිලිව නම්කළ රූප සටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න.

(b) කෘමිනාශක ඉසීමේ දී යොදාගත යුතු පූර්ව ආරක්ෂක උපක්‍රම විස්තර කරන්න.

(c) විවිධ බෝග සංස්ථාපන ක්‍රම විස්තර කරන්න.

02 (a) කාබනික ද්‍රව්‍ය මගින් පසෙහි සාරවත් බව වැඩිදියුණු කරන ආකාරය විස්තර කරන්න.

(b) බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රමයක් විස්තර කරන්න.

(c) වියළීමේ දී ආහාරවල සිදුවන භෞතික හා රසායනික වෙනස්කම් විස්තර කරන්න.

03 (a) යම් ව්‍යාපාරයක නිෂ්පාදනය ඉහළ යන විට ලාභය සීමාකාරී වේ. මෙම තත්ත්වයට බලපාන සාධක කවරේ ද?

(b) ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි දේශගුණික කලාප සපයා ඇති සිතියමෙහි සටහන් කරන්න. එක් එක් කලාපයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය දක්වන්න.

(c) කොම්පෝස්ට් සෑදීමේ ප්‍රධාන පියවර විස්තර කරන්න.

04 (a) මිශ්‍ර බෝග වගාවේ වාසි හා අවාසි සඳහන් කරන්න.

(b) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනයේ වැදගත්කම විස්තර කරන්න.

(c) හොඳින් සැකසූ පසක ලක්ෂණ කවරේ ද?

05 (a) පැහැදිලිව නම් කළ රූප සටහනක් ආධාරයෙන් ද්විබීජ පත්‍රී බීජයක එක් එක් කොටසේ ප්‍රධාන කාර්යය විස්තර කරන්න.

(b) වායව අතු බැඳීමේ වාසි මොනවා ද? වායව අතු බැඳීම රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.

(c) එළදෙනකගේ ක්ෂීර පද්ධතියේ රූප සටහනක් යොදාගනිමින් ක්ෂීර ක්‍රියාවලිය විස්තර කරන්න.

06 (a) කුඩා පරිමාණ බ්‍රොයිලර් කුකුළු ගොවිපළක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු විවිධ සාධක ලැයිස්තුගත කරන්න. ඉහත සාධක ගොවිපළෙහි සාර්ථකත්වයට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(b) ජාන සම්පත් සංරක්ෂණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(c) කෘෂිකාර්මික බෝග කෙරෙහි දුර්වල ජලවහන තත්ත්වයන්ගේ අහිතකර බලපෑම් සඳහන් කරන්න.